කර්මාන්ත අමාත්‍යාංශය
கைத்தொழில் அமைச்சு
Ministry of Industries











# ජාතික මෝස්තර මධ්‍යස්ථානය

## කාර්ය සාධන විශ්ලේෂණ වාර්තාව

සැලසුම් අංශය - 2024

# ජාතික මෝස්තර මධ්‍යස්ථානය

**හැඳින්වීම**

ජාතික මෝස්තර මධ්‍යස්ථානය 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා හා අනුබද්ධ ආයතන පනත යටතේ 1983 වර්ෂයේදී ආරම්භ කරන ලද, මේ වන විට කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දේශිය හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය නංවාලීම තුළින් ශිල්පීන්ගේ අභිවෘද්ධිය මූලික අරමුණ කරගත් ව්‍යවස්ථාපිත ආයතනයකි.

දැක්ම :-

හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය වඩාත් සක්‍රීය ආර්ථික ක්ෂේත්‍රයක් බවට පත් කිරීම.

මෙහෙවර :-

හස්ත කර්මාන්ත ප්‍රවර්ධනය, සංවර්ධනය, හැකියාවන් ගොඩනැංවීම, ප්‍රචලිත කිරීම සහ ප්‍රධාන ප්‍රවාහයට අනුගත කිරීම තුළින් ගෝලීය සහ දේශීය වෙළෙඳපොළ ප්‍රවණතාවලට අනුකූලව වෙළෙඳපොළ පාදක කරගත් නිර්මාණාත්මක මෝස්තර හඳුන්වා දීම.

ප්‍රධාන වගකීම් ක්ෂේත්‍රය :- හස්ත කර්මාන්ත පෝෂණය කිරීම, සංරක්ෂණය කිරීම හා සංවර්ධනය කිරීම

ප්‍රධාන අරමුණු

- හස්ත කර්මාන්ත ශිල්පීන් විසින් දැනට නිෂ්පාදනය කරනු ලබන අත්කම් භාණ්ඩ සංවර්ධනය කිරීම සහ දේශීය මෙන්ම අපනයන වෙළඳපළෙහි වර්තමාන සහ අනාගත වෙළඳපළ නැඹියාවන්ට අනුව නව නිර්මාණ හඳුන්වා දීම.

- සුදුසු තාක්ෂණය හඳුන්වාදීම සහ තත්ත්ව ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණික ආයතන සමඟ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සහ ගුණාත්මක නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා නිසි තාක්ෂණික හා අමුද්‍රව්‍ය සැකසීමේ ක්‍රම හඳුන්වාදීම.

- ආදායම් වැඩිකර ගැනීම තුළින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ වඩාත් යහපත් වර්ධනයක් අරමුණු කරගෙන ශිල්පීන්ට උසස් ශිල්පීය, තාක්ෂණික හා මෝස්තර සංවර්ධන පුහුණු සහාය ලබාදීම.


- හස්ත කර්මාන්ත ශිල්පීන්ට, කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට සහ මහජනතාවට අවශ්‍ය දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමට පහසුකම් සැලසීම සහ පොදු පහසුකම් සැලසීම සඳහා සේවාවන් ලබාදීම.

- හස්ත කර්මාන්ත නිර්මාණ සඳහා වඩාත් කාර්යක්ෂම, නව්‍ය නිෂ්පාදන ක්‍රමවේද හඳුන්වාදීම.

- නව නිර්මාණාත්මක හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වෙළඳපොළ වැඩිදියුණු කිරීම.

- රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් වලට අනුව මෝස්තර උපදේශක සේවාවන් ලබාදීම.

- වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් හා පුහුණු කිරීම් හරහා මෝස්තර නිර්මාණාත්මක හැකියාවන් වැඩිදියුණු කිරීම.





**ආයතනය මුහුණ දෙන අභියෝග**

ආයතනයේ සංවර්ධන ක්‍රියාවලියට සෘජුව දායක වන කාර්ය මණ්ඩලය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් 37% ක් පුරප්පාඩු වී ඇති බැවින් සීමිත කාර්ය මණ්ඩලයක් සමඟ වැඩ කටයුතු කරගෙන යාමට සිදුවීම.

**කාර්ය සාධන විශ්ලේෂණය**


**හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා වෙළඳපල ඉලක්ක කරගත් නව නිර්මාණ සැලසුම් කිරීම**




**ප්‍රස්තාර අංක 01**

| ප්‍රස්තාර අංක 01 හි විස්තරය | Year | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **2017** | **2018** | **2019** | **2020** | **2021** | **2022** | **2023** |
| සැලසුම් කරන ලද නව නිර්මාණ සංඛ්‍යාව | 605 | 835 | 851 | 438 | 356 | 549 | 509 |
| නිෂ්පාදනය කරන ලද නව මූලාශ්‍ර සංඛ්‍යාව | 516 | 507 | 662 | 354 | 278 | 343 | 432 |


පවත්වන ලද නව නිර්මාණ සහ නව තාක්ෂණ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව




ප්‍රස්තාර අංක 02

| ප්‍රස්තාර අංක 02 හි විස්තරය | Year | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **2017** | **2018** | **2019** | **2020** | **2021** | **2022** | **2023** |
| පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 24 | 34 | 41 | 13 | 24 | 25 | 17 |


නව නිර්මාණ පුහුණු වැඩසටහන්




ප්‍රස්තාර අංක 03

| ප්‍රස්තාර අංක 03 හි විස්තරය | Year | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **2017** | **2018** | **2019** | **2020** | **2021** | **2022** | **2023** |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 592 | 823 | 965 | 299 | 553 | 511 | 402 |
| හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | 423 | 551 | 450 | 230 | 186 | 189 | 216 |

**සිදුකරන ලද විවිධ ව්‍යාපෘති යටතේ නව නිර්මාණ පුහුණුව ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව**




**ප්‍රස්තාර අංක 04**


**ප්‍රස්තාර අංක 04 හි විස්තරය**

| ව්‍යාපෘතියේ නම | අරමුදල් මූලාශ්‍රය | 2017 | | 2018 | | 2019 | | 2021 | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ව්‍යාපෘතියේ වටිනාකම රු.මි. | ප්‍රතිලාභීන් ගණන | ව්‍යාපෘතියේ වටිනාකම රු.මි. | ප්‍රතිලාභීන් ගණන | ව්‍යාපෘතියේ වටිනාකම රු.මි. | ප්‍රතිලාභීන් ගණන | ව්‍යාපෘතියේ වටිනාකම රු.මි. | ප්‍රතිලාභීන් ගණන |
| යූඑන්ඩීපී හා ඔක්ස්ෆෑම් ව්‍යාපෘති | රාජ්‍ය නොවන | | 222 | | | | | | |
| රැකියා විරහිත තරුණයින් සහ සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා නව සහ නව්‍ය නිර්මාණ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන. | අමාත්‍යාංශ | 22.73 | 527 | | | | | | |
| ව්‍යවසාය ගම්මානය සංවර්ධන සහ කාන්තා ව්‍යවසායකත්ව වැඩසටහන | අමාත්‍යාංශ | 8.0 | 198 | 1.8 | 256 | 0.8 | 156 | | |
| බතික් නව නිර්මාණ පුහුණු වැඩසටහන | අමාත්‍යාංශ | | | | | | | 6.8 | 300 |

**වෙළඳපළට ගැලපෙන නිර්මාණ හඳුන්වාදීම සහ වෙළඳපල සම්බන්ධතා ඇතිකිරීම**

පහත ප්‍රස්තාරය පිළිබඳ සලකා බැලීමේදී, සමස්තයක් ලෙස 2017 වසරේ සිට 2019 වසර දක්වා ඉහළ කාර්ය සාධනයක් දක්නට ලැබේ. නමුත් 2020 වසරේ සිට ඉලක්කගත ප්‍රගතියේ අඩුවීමක් දක්නට ලැබේ.එම ප්‍රගතිය පහත වැටීමට බලපෑ කරුණු මෙසේය.

- 2020 සහ 2021 වර්ෂවල කොවිඩ්19 වසංගතය පැතිරීම
- 2022 ඉන්ධන අර්බුදයට මුහුණ දීම
- අත්‍යවශ්‍ය අමුද්‍රව්‍යවල ඌනතාවය සහ විශාල මිල වැඩිවීම
- මෙම කාලසීමාව තුළ අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවාගෙන නොමැති වීම.
- රාජ්‍ය වියදම් සීමා කිරීම සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛ යටතේ භාණ්ඩාගාර ප්‍රතිපාදන අඩු කිරීම




**ප්‍රස්තාර අංක 05**


**පර්යේෂණ හා සංවර්ධන (රසායනික) ක්‍රියාකාරකම්**

| වර්ෂය | ව්‍යාපෘතිය | තත්ත්වය |
|---|---|---|
| 2017 | තල්කොළ අත්කම් මත දිලීර වර්ධනය සම්බන්ධව අධ්‍යයනය | දිලීර කාණ්ඩය සෙවීම |
| 2018 | මැටි මත වර්ණ ආලේප කිරීම සම්බන්ධව පර්යේෂණ සිදුකිරීම | වැඩමුළු ගණන - 2 |
| | තල්කොළ අත්කම් භාණ්ඩ මත දිලීර වර්ධනය පාලනය සඳහා ප්‍රතිකාර ක්‍රම සෙවීම සඳහා පර්යේෂණ සිදු කිරීම. | මොරටුව විශ්ව විද්‍යාලය සමග ආරම්භ කළ පර්යේෂණ ව්‍යාපෘතිය 2019 වසර තුළද සිදුකරනු ලැබේ. |
| | තල්කොළ අත්කම් සඳහා භාවිතා කරන වර්ණක වල තත්වය පිළිබඳ අධ්‍යයනය කිරීම. | වර්ණ ගන්වන ලද සාම්පල පර්යේෂණය කර ප්‍රතිඵල දක්වන ලදී. |
| 2019 | තල්කොළ මත දිලීර වර්ධනය පාලනයට සුදුසු ප්‍රතිකාර ක්‍රම හඳුනාගැනීමට පර්යේෂණ සිදු කිරීම. | මොරටුව විශ්ව විද්‍යාලය සම්බන්ධ කරගනිමින් සිදුකළ පර්යේෂණ අවසන් කරන ලදී. |
| 2019 | අත්කම් ක්ෂේත්‍රය සඳහා හඳුන්වාදිය හැකි දැනට සිදුකර ඇති පර්යේෂණ සොයාගැනීම් පිළිබඳ තොරතුරු සෙවීම. | ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කිරීම.<br><br>ITI ජල පෙරණය පරීක්ෂා කිරීම.<br><br>මන්නාරම, වීරවිල සහ වවුනියාව යන ප්‍රදේශ තුළ සමීක්ෂණ පැවැත්වීම. |

| වර්ෂය | ව්‍යාපෘතිය | තත්ත්වය |
|---|---|---|
| | කාර්මික තාක්ෂණ ආයතනය (ITI) මගින් සිදුකර ඇති ජල පෙරණ ව්‍යාපෘතිය | දත්ත විශ්ලේෂණය කර සමීක්ෂණ වාර්තාව සැකසීම. |
| | තල්කොළ අත්කම් ක්ෂේත්‍රය පිළිබඳ සමීක්ෂණ සහ දත්ත රැස් කිරීම. | |
| | කොහු අත්කම් සඳහා විකල්ප වර්ණක පිළිබඳ අධ්‍යයනය | |
| 2020 | අත්කම් සඳහා යෙදිය හැකි උසස් තත්වයේ පවතින වර්ණක පිළිබඳ සෙවීම. | සිදුකරමින් පවතී. |
| | පර්යේෂණ සොයාගැනීම් අත්කම් ක්ෂේත්‍රයට යොදාගැනීම පිළිබඳ අධ්‍යයනය | ITI ජල පිල්ටරය පරීක්ෂා කිරීම. |
| | බතික් අපජලය පිරිපහදු කිරීම පිළිබඳ අධ්‍යයනය කිරීම.<br><br>බතික් අපජලය පිරිපහදු කිරීම සඳහා මහනුවර නත්තරම්පොත ජා.මෝ.ම. ශාඛා කාර්යාලය පරිශ්‍රයේ බතික් අපජලය පිරිපහදු කිරීමේ පද්ධතියක් ඉදිකිරීම. | සාහිත්‍යමය (Literature) තොරතුරු අධ්‍යයනය සම්පූර්ණ කරන ලදී. |
| 2021 | බස්නාහිර පළාතේ බතික් කර්මාන්තය පිළිබඳ තොරතුරු රැස්කිරීමට සමීක්ෂණයක් පැවැත්වීම. | බස්නාහිර පළාත තුළ සමීක්ෂණය පැවැත්වීම සහ දත්ත විශ්ලේෂණය |
| | බතික් කර්මාන්තකරුවන් රසායන ද්‍රව්‍ය ආරක්ෂිතව භාවිතය පිළිබඳ දැනුම්වත් කිරීම. | වැඩමුළුවක් පැවැත්වීම. (සූම් තාක්ෂණය හරහා) |
| | මී කිරි මිදවීම සඳහා වරක් භාවිතා කරන ලද මැටි බඳුන් නැවත භාවිතය පිළිබඳ සොයා බැලීම.<br><br>ජල පිරිපහදුවේදී සැදෙන රොන්මඩ මැටි කර්මාන්තය සඳහා යොදාගැනීම පිළිබඳ පර්යේෂණ සිදු කිරීම. | සම්පූර්ණ කරන ලදී.<br><br>ජාතික ජල සම්පාදන මණ්ඩලය සමග සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම. |
| 2022 | බතික් ක්ෂේත්‍රය සඳහා ප්‍රමිතිකරණ පද්ධතියක් සකස් කිරීම - GMP (විධිමත් නිශ්පාදන ක්‍රියාපිළිවෙත්) කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම. | GMP ප්‍රමිති කෙටුම්පත් සැකසීම - සිදුකෙරෙමින් පවතී. |
| | බතික් කර්මාන්තය සඳහා යෙදිය හැකි උසස් තත්වයේ පවතින වර්ණක පිළිබඳ ක්ෂෙත්‍ර අධ්‍යයන | ක්ෂේත්‍ර වැඩමුළුව පැවැත්වීම - රත්මලාන |
| | තල්කොළ දිලීර පාලනය සඳහා යෙදිය හැකි දිලීර නාශක දියරයක් පිළිබඳ සෙවීම. | ක්ෂේත්‍ර අධ්‍යයනයක් පැවැත්වීම - වීරවිල |

| වර්ෂය | ව්‍යාපෘතිය | තත්ත්වය |
|---|---|---|
| | ජල පිරිපහදුවේදී සෑදෙන රොන්මඩ මැටි ආශ්‍රිත අත්කම් සඳහා යෙදීම පිළිබඳ පර්යේෂණ | ජාතික ජල සම්පාදන මණ්ඩලය සමග සහයෝගිතා ව්‍යාපෘතියක් සිදුකරමින් පවතී. |
| 2023 | දේශීය විශ්ව විද්‍යාල සහ අනෙකුත් ආයතන සමග සහයෝගීතා පර්යේෂණ ව්‍යාපෘති සිදුකිරීම. | මෙම ජා.මෝ.ම. සහ ජාතික විද්‍යා පදනම අතර සහයෝගීතා ව්‍යාපෘතියක් රු. මිලියන 1.85 ක් යොදවමින් සිදුකිරීමට සැලසුම්කර තිබුණද ප්‍රතිපාදන නොලැබීම නිසා ක්‍රියාත්මක නොවුණි. රාජ්‍ය අමාත්‍ය ප්‍රසන්න රණවීර මහතාගේ ඉල්ලීම මත (2023/08/15 දින පැවති රැස්වීමේදී) කුඩා ප්‍රමාණයේ බතික් අපජලය පිරිපහදු කිරීමේ පද්ධතියක් මෙම ප්‍රතිපාදන වලින් කොටසක් වැයකර සිදුකරන ලදී. මේ යටතේ බතික් අපජලය පරික්ෂා කිරීම සහ දිනකට ලීටර් 500ක් පිරිපහදු කළ හැකි අපජලය පිරිපහදු කිරීමේ පද්ධතියක් ගම්පහ මිරිස්වත්ත ජාතික ශිල්ප සභාවේ පුහුණු මධ්‍යස්ථානය තුළ ඉදිකරණ ලදී. ඉදිකිරීම් කටයුතු අවසන් වුවද බතික් අපජලය සැපයුම පිළිබඳ ගැටළුවක් නිසා මෙය ක්‍රියාත්මක කර පරීක්ෂා කිරීම සිදු කළ නොහැකි විය. |
| | ජල පිරිපහදුවේදී සෑදෙන රොන්මඩ මැටි ආශ්‍රිත කර්මාන්ත සඳහා යෙදීම පිළිබඳ ව්‍යාපෘතිය | ජාතික මෝස්තර මධ්‍යස්ථානය සහ ජාතික ජලසම්පාදන මණ්ඩලය අතර මෙම ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.<br><br>මෙම ව්‍යාපෘතිය යටතේ මහායාල මැටි කර්මාන්තකරුවන් වෙත මෙම මැටි විකල්ප අමුද්‍රව්‍යක් ලෙස නොමිලේ ලබා දුන් අතර ජා.මෝ.ම. තුළ පස් දෙනෙකු ලියාපදිංචි වී මෙම මැටි ලබා ගන්නා ලදී. |
| | ශාක සාර අවශේෂ භාවිතයෙන් ස්වභාවික වර්ණක නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපෘතිය | සාහිත්‍යමය (Literature) තොරතුරු අධ්‍යයනය<br><br>ව්‍යාපෘති යොජනාව සකස් කිරීම සහ කර්මාන්ත අමාත්‍යංශය වෙත ඉදිරිපත් කිරීම.<br><br>SLINTEC, ආයතනය සමඟ සාකච්ඡා කිරීම<br><br>මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුමක් සැකසීම.<br>SLINTEC, කර්මාන්ත අමාත්‍යංශය සහ ජා.මෝ.ම. අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම. |

**පර්යේෂණ හා සංවර්ධන (යාන්ත්‍රික) ක්‍රියාකාරකම්**





**ප්‍රස්තාර අංක 06**

**පර්යේෂණ සහ සංවර්ධන (යාන්ත්‍රික)ක්‍රියාකාරකම්**

| වර්ෂය | ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් |
|---|---|---|
| 2019 | හණ කෙඳි සැකසීමේ යන්ත්‍රය සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම | සෘජු: 03<br>වක්‍ර : 10 |
| 2020 | ලැකර් ලේත් හෝල්ඩර් උපාංගය සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම | සෘජු: 03<br>වක්‍ර : 10 |
| 2021 | උණ බම්බු වාෂ්ප යන්ත්‍රය සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම | |
| 2022 | හණ කෙඳි සැකසීමේ යන්ත්‍රය වැඩිදියුණු කිරීම | සෘජු: 03<br>වක්‍ර : 10 |
| | දැනට පවත්නා පන් පදම් කිරීමේ යන්ත්‍රය සඳහා සියුම් වේග පාලන යාන්ත්‍රණයක් සැකසීම හා එය කොහු ලණු පටි තැලීමේ ක්‍රියාවලිය සිදුකිරීම සඳහා වැඩිදියුණු කිරීම | සෘජු: 04<br>වක්‍ර : 10 |
| | දැනට පවත්නා අතින් ක්‍රියාත්මක කරනු ලබන පන් පදම් කිරීම සඳහා භාවිතා කරන යන්ත්‍රයක් මෝටර් බලයෙන් ක්‍රියාත්මක කරන යන්ත්‍රයක් බවට වැඩි දියුණු කිරීම | සෘජු: 02<br>වක්‍ර : 10 |
| | ජා.මෝ.ම. වැඩහල සඳහා නඩත්තු ක්‍රමෝපායන් හඳුන්වාදීම සහ ඒවා වැඩි දියුණු කිරීම | සෘජු: 20<br>වක්‍ර : 50 |
| | ජා.මෝ.ම. වැඩහල සඳහා පිරිවැය සඵලදායී, යෝග්‍ය, දුහුවිලි බැහැර කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී ස්ථාපිත කිරීම | සෘජු: 20<br>වක්‍ර : 50 |

| වර්ෂය | ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් |
|---|---|---|
| 2023 | දක්ෂ ශිල්පීන් නිර්මාණය කිරීම සඳහා නවීන වෘත්තීය සහ තාක්ෂණික යෙදවුම් ලබා දීම.<br><br>- පන් හා කෙඳි අංශය සඳහා අර්ධ ස්වයංක්‍රීය පන් සකස් කරන යන්ත්‍රය ප්‍රදර්ශනය කිරීම<br><br>-හස්ත කර්මාන්ත අංශය වැඩි දියුණු කිරීම සහ නවීකරණය කිරීම සඳහා නව නවෝත්පාදන, නව තාක්ෂණයන්, නව යන්ත්‍රෝපකරණ, උපකරණ සහ මෙවලම් හඳුන්වා දීම.<br><br>- කොහු කර්මාන්තය සඳහා මූලික රටා වියන යන්ත්‍රය සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම<br><br>- මැටි කර්මාන්තය සඳහා බහු-කාර්ය මැටි පහන් සාදන යන්ත්‍රය සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම<br><br>- නොක්-ඩවුන් තාක්ෂණය (Knock-Down Technology) ලාක්ෂා කර්මාන්ත ක්ෂේත්‍රයට හඳුන්වාදීම මඟින් ගෘහ භාණ්ඩ තැනීම දක්වා එම ක්ෂේත්‍රය යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය | සෘජු: 25 |
| | සුනිසි රැකියාවක් පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු කිරීම් පැවැත්වීම | සෘජු: 40 |

**ජාතික මෝස්තර මධ්‍යස්ථානය යටතේ පවත්නා ශ්‍රී ලංකා පිරිනිර්මාණ ආයතනයේ ක්‍රියාකාරකම්**




**ප්‍රස්තාර අංක 07**

ප්‍රස්තාර අංක 07 වෙත අවධානය යොමු කිරීමේදී . 2018 සහ 2019 දී ආරම්භ කරන ලද පාඨමාලා 2020 දී අවසන් කිරීමට සැලසුම් කරන ලදි. නමුත්,, 2020 දී කොවිඩ්-19 වසංගතය හේතුවෙන්, එම පාඨමාලා සම්පූර්ණ කිරීමට හා නව බඳවා ගැනීම් සිදු කිරීමට අවස්ථාව නොලැබුණි.

**මූල්‍ය තත්ත්වය**

**රු.මි.**

| විස්තරය | වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **2017** | **2018** | **2019** | **2020** | **2021** | **2022** | **2023** |
| ස්ථාවර වත්කම් | 53.9 | 68.9 | 44.2 | 45.1 | 142.5 | 170.8 | 158.5 |
| ජංගම වත්කම් | 45.6 | 51.9 | 43.3 | 39.7 | 36.3 | 43.0 | 45.3 |
| ජංගම වගකීම් | 10.2 | 11.3 | 11.6 | 10.4 | 15.6 | 8.9 | 10.3 |
| දිගුකාලීන වගකීම් | 24.7 | 25.0 | 24.7 | 28.3 | 25.3 | 26.7 | 25.5 |

**රු.මි.**

| විස්තරය | වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **2017** | **2018** | **2019** | **2020** | **2021** | **2022** | **2023** |
| ප්‍රාග්ධන අයවැය | 100.0 | 80.0 | 68.3 | 30.0 | 80.0 | 30.0 | 40.0 |
| - නිදහස් කරන ලද | 16.8 | 46.3 | 45.9 | 21.4 | 37.6 | 20.0 | 26.11 |
| - සත්‍ය වියදම | 16.8 | 46.3 | 44.4 | 19.3 | 41.2 | 9.7 | 26.11 |
| පුනරාවර්ථන - නිදහස් කරන ලද | 58.0 | 61.0 | 68.7 | 67.8 | 72.6 | 67.3 | 72.04 |
| වැටුප් හා වේතන | 32.5 | 37.4 | 42.8 | 45.1 | 44.3 | 40.7 | 41.0 |
| - අතිකාල ගෙවීම් හා වෙනත් දීමනා | 18.4 | 16.2 | 16.7 | 13.5 | 16.9 | 16.0 | 19.0 |
| අනෙකුත් ඉපයීම් | 1.5 | 3.0 | 1.2 | 0.2 | 1.0 | 1.0 | 1.4 |
| **ශ්‍රී ලංකා පිරිනිර්මාණ ආයතනය** | | | | | | | |
| ආයතනික ගාස්තු | 2.8 | 2.8 | 3.7 | 2.5 | 2.2 | 8.0 | 6.5 |
| වියදම් | 1.3 | 2.5 | 3.7 | 2.5 | 1.3 | 4.2 | 4.6 |
| ප්‍රාග්ධන වෙන්කිරීම් වලින් වියදමක් නම් | - | - | - | - | 2.8 | - | - |

**ආයතනය වැඩිදියුණු කිරීම සඳහා යෝජනා**

- ශිල්පීය සහ නිර්මාණ ක්ෂේත්‍රයේ රැකියා සඳහා පවතින ඉහළ ඉල්ලුමට සරිලන පරිදි ජාතික මෝස්තර මධ්‍යස්ථානය ඇති ශ්‍රී ලංකා ජාතික නිර්මාණ ආයතනයේ දැනට පවතින පාඨමාලාවල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සහ ශිල්ප හා නිර්මාණ සම්බන්ධ නව පාඨමාලා ආරම්භ කිරීම.

- දක්ෂතා ඇති පුද්ගලයින්ගේ හැකියාවන් සංවර්ධනය කිරීම සඳහා වත්මන් කාර්ය මණ්ඩලය සහ ආයතනයේ පවතින සම්පත් ඵලදායී ලෙස භාවිතා කරමින් විවිධ හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර යටතේ අඛණ්ඩ කෙටි කාලීන පුහුණු සැසි පැවැත්වීම.

- ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛා කාර්යාලයේ වැඩහල තුළ දැනට පවතින හස්ත කර්මාන්ත අංශවලට අමතරව වර්තමාන සහ අනාගත වෙළෙඳපොළ සඳහා ඉහළ ප්‍රවණතාවක් ඇති හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා සේවා සැපයීමට නව වැඩහළ අංශ පිහිටුවීමට යෝජනා කෙරේ.

- ගෝලීය ප්‍රවණතා සමඟ ඉදිරියට යාමට ආයතනයේ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කර ගැනීම සඳහා විදේශීය අවස්ථා (ප්‍රදර්ශන, වෙළඳ ප්‍රදර්ශන, වැඩමුළු සහ සම්මන්ත්‍රණ වැනි) ලබා ගැනීම

- නිර්මාණකරුවන්, ශිල්පීන් සහ වෙළඳපොළ සම්බන්ධ කිරීම සඳහා දේශීය හා ගෝලීය වේදිකාවක් ලෙස ජාතික මෝස්තර මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම.

- ආයතනයේ අනාගත සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා පුරප්පාඩු වූ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

- සහකාර අධ්‍යක්ෂ සැලසුම්, පර්යේෂණ නිලධාරී සහ තොරතුරු තාක්ෂණ නිලධාරී යන නව තනතුරු අවශ්‍යතා ආයතනයේ කාර්ය මණ්ඩලයට ඇතුළත් කිරීමට අනුමැතිය ලබා ගැනීම.

- පර්යේෂණ සහ සංවර්ධන අංශය සඳහා(R&D) රසායනාගාරයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම